කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහා භාණ්ඩාගාරය, කොළඹ 01. பொது திறைசேரி, கொழும்பு 01. General Treasury, Colombo 01.

මගේ අංකය / எனது இல. / My No. DMS/CAD/SOR/SLIATE

ඔබේ අංකය / உமது இல. / Your No. HE/AD/11SLIATE CADRE

දිනය / திகதி / Date 2026.07.07

SLIATE 07 JUL 2026 Director General

ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම්තුමනි

අනුමත බඳවා ගැනීමේ සංශෝධනය කර ගැනීම.
අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහකාර කථිකාචාර්ය (AR 1 – Grade II), කථිකාචාර්ය (AR 1 – Grade I), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (AR 2) හා ශිල්ප ප්‍රදර්ශක තනතුරු - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2026.06.11 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මගින් ඔබ විසින්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සහකාර කථිකාචාර්ය/ කථිකාචාර්ය, ශිල්ප ප්‍රදර්ශක යන තනතුරු සඳහා මගේ සමාංක හා 2026.04.22 දිනැතිව අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිවල සංශෝධන කිහිපයක් සිදු කර අනුමත කර දෙන මෙන් ඉල්ලා ඇත.

03. ඒ අනුව 2026.04.22 දිනැතිව අනුමත කරන ලද සහකාර කථිකාචාර්ය/ කථිකාචාර්ය තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 5.1 යටතේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ බාහිර අයදුම්කරුවන් යටතේ වන අනු අංක 2 ඉවත් කර සංශෝධනය කර මේ සමඟ යොමු කරමි.

04. තවද, සහකාර කථිකාචාර්ය/ කථිකාචාර්ය තනතුරේ බඳවාගැනීමේ තනතුර සහකාර කථිකාචාර්ය තනතුර වන අතර එම තනතුරේ I ශ්‍රේණියට උසස් වීමේ තනතුර කථිකාචාර්ය තනතුර වන බව කාරුණිකව දන්වා සිටිමි.

05. තවද, එම ලිපිය මගින් ඉල්ලුම් කර ඇති අනෙකුත් සංශෝධන සඳහා මෙම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා දිය නොහැකි බවත්, 2026.04.22 දිනැතිව අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව තවදුරටත් බලපවතින බවත් කාරුණිකව වැඩිදුරටත් දන්වා සිටිමි.

මෙයට - විශ්වාසී

එම්.කේ.ඩී.එන් මාදම්පෙ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :
1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
4. පොදු ගොනුව
5. බඳවාගැනීමේ පරිපාටි අංශය

කාර්යාලය / அலுவலகம் / Office 011- 2484757, 011- 2484640
ෆැක්ස් / தொலைநகல் / Fax 011- 2430270, 011- 2484846
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail dgms@msd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.treasury.gov.lk